**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය මතය

-------------------------

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඈ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. එලෙස වාර්තා නොකරන ලද රු.11,557,017 ක බැරකම් 2019 වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. | 2018 ඔක්තෝබර් 19 දිනැති අංක 266/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.11 ඡේදය ප්‍රකාරව වාර්තා කළ යුතු වීම | සිගාස් වැඩසටහන යටතේ හඳුනාගත් බැරකම් ඇතුළත් කළ අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත බැදීම්, බැරකම් පිළිබඳ වාර්තා යැවීමට ඉදිරියේ දී කටයුතු කරන බැව් කාරුණිකව දන්වමි. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ වටිනාකම රු.1,922,166,505 ක් වූ වත්කම් පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි අංක 8 පොදු උපදෙස්හි 8.1 ඡේදය අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කළ යුතු වීම. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි අංක 8 පොදු උපදෙස්හි 8.1 ඡේදයෙහි සඳහන් සිගාස් පරිගණක වැඩසටහනින් ලබා BOSS වාර්තාවේ පිටපතක් විගණන කටයුතු සඳහා ලබා දී ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 02 ක වත්කම් වටිනාකම රු.40,746,779 ක් වූ අතර, මිලදී ගැනීම් විස්තර අනුව එය රු.40,868,619 ක් විය. ඒ අනුව මිලදී ගැනීම් වටිනාකමේ රු.121,840 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදි වත්කම් වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | එම වෙනසට හේතු වී ඇත්තේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ (1201) හා 2001 වැය විෂයට ගිණුම් ගත විය යුතු අයිතම කිහිපයක් වැරදීමකින් ඉහත වැය විෂය සඳහා ගිණුම් ගත වීමය. ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදු නොවීමට සටහන් කර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාහන දෙකක් විකිණීමෙන් ලද වටිනාකම රු.1,512,000 ක් වූ අතර, එහි අපහරණ වටිනාකම රු.1,807,456 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.295,456 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදි වත්කම් වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | වාහන විකිණීමෙන් ලද සත්‍ය ආදායම රු.1,512,000.00 බව පිළිගන්නා අතර අතපසු වීමකින් වෙනත් අපහරණ ආදායම් වන රු.295,456.00 ක මුදලද ඊට ඇතුලත් වාහන අපහරණ කිරීම් ලෙස දක්වා ඇති අවශ්‍ය නිවැරදි කිරීම් කර ඉදිරි වර්ෂයේදී ඉදිරියට ගෙනා ශේෂය නිවැරදිව ගණනය කිරීම සඳහා සටහන් තබන ලදී. |
| (ඇ) | 2015 වර්ෂයේදී රු.7,400,000 කට මිලදී ගන්නා ලද මෝටර් රථයක් 2016 වර්ෂයේ පූර්ණ අලාභ (අනතුරක් සිදු වී) යටතට ගෙන තිබූ නමුත් එය 2017 වර්ෂයේදීද ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදීද එය පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදි වත්කම් වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වාහනය පරීක්ෂාව සඳහා පූර්ණ හානි පූර්ණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලබාදීමට නොහැකි බව දන්වා ඇති අතර මේ පිළිබඳ මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දරන මතය වන්නේ පූර්ණ හානි පූර්ණයක් ලැබිය යුතු බවය. කෙසේ වුව ද මෙම වාහනය පූර්ණ අලාභය යටතට ගෙන තිබුන ද ඒ පිළිබඳ තත්සේරු වටිනාකමෙහි ගැටළු සහගත භාවය නිසා තව දුරටත් පොත් වලින් කපාහැරීම් පිළිබඳ තීරණයක් ගෙන නොමැත. |
| (ඈ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂයන් සහ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර තිබූ වත්කම් ලේඛනයේ ශේෂයන් අතර රු.305,415,325 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදි වත්කම් වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | 2017 විසර්ජන ගිණුම අනුව ජංගම නොවන සංචලන වාර්තාවේ කෙරීගෙන යන වැඩ ලෙස සඳහන් කර ඇති රු.53,944,676.33 ක මුදල නිවැරදි නොවේ. එම මුදල රු.41,516,944.00 ලෙස නිවැරදි විය යුතුය.<br>9153 ඉඩම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉඩම් සඳහා වූ ශේෂය ලෙස රු.86,945,000.00 ශේෂය නිවැරදි නොවන බව සඳහන් කරන අතර පරිගණක ගත කිරීමේදී ඇති වූ දෝශයක් හේතුවෙන් මෙම වෙනස ඇතිවූ අතර ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ වත්කම් ලේඛණය අනුව ශේෂය වන රු.66,945,000.00 නිවැරදි වන බව සඳහන් කරමි. |

### 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිලධාරින් 6 දෙනෙකුගේ වසර දෙක ඉක්ම වූ හිඟ ණය ශේෂය රු.266,426 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වීම. | දැනට නිවැරදිව පවත්වාගෙනයාමට කටයුතු කරන අතර ඉදිරියේදී ඉදිරිපත් කරමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. | බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන බැව් කාරුණිකව දන්වමි. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | පොදු තැන්පත් ගිණුම් 2 ක වර්ෂ 02 ක් ඉක්මවූ රු.5,927,512 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රු.75,000 වටිනා ආරක්ෂක තැන්පතු අලුත් කිරීමට හා කොන්ත්‍රාත් තැන්පතු රු.5,852,513 සඳහා අදාල වැඩ පිළිබඳ පරීක්ෂා කර කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීමෙන් අනතුරුව එම මුදල් කොන්ත්‍රාත්කරු වෙත මුදාහැරීම හෝ රජයේ ආදායමට මාරු කිරීමට පියවර ගැනීමට උපදෙස් දෙන ලදී. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 ඡේදය | සෑම වර්ෂයකටම අපහරණය කළ යුතු වාහන හඳුනා ගෙන ඒ පිළිබඳ තොරතුරු අදාළ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර හා අපහරණ ක්‍රියාවලිය නිම කිරීමෙන් අනතුරුව වාහන දෙක පිළිබඳ තොරතුරු අදාළ වර්ෂයේ ජුනි 30 දිනට ප්‍රථම පිළිවෙලින් ආකෘති අංක 01 හා අකෘති අංක 02 නියමිත පරිදි සම්පූර්ණ කර මෙම උපදෙස් ප්‍රකාරව අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම | අකෘති අංක 02 සති දෙකක් ඇතුලත යැවීමට |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය 2.2 ඡේදය | කාණ්ඩ අංකය II යටතේ වාහන ප්‍රසම්පාදනයේදී ඉල්ලීමක් ඉදිරිපත් කර තිබූ බවට සහ වාහන 5ක අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව තුළින් හඳුනාගත් බව තහවුරු කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | | | |
| | (i) 4.2.1 (ආ) වගන්තිය | අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂයට පමණක් සීමා වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| | (ii) 4.1.1(අ) වගන්තිය | ගමන් බලපත් පරිලෝකන යන්ත්‍ර 69 ක් රු.16,138,728 කට මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| | (iii) 5.3.13 හා 5.4.10 (ආ) වගන්ති | මෝටර් රථයක් ලබා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසුකරුවන් විසින් රු.200,000 වටිනා ලංසු සුරක්ෂණයන් හා රු.195,600 ක් වටිනා වලංගු වන කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| | (iv) 5.6 වගන්තිය | ගමන් බලපත්‍ර පරිලෝකන යන්ත්‍ර 69 ක් හා ටෝනර් 685 ක් මිලදී ගැනීම් වටිනාකම රු.28,468,728 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ඉ) | 2016 ඔක්තෝබර් 04 දිනැති අංක සීඑස්ජ්/1/38 දරන ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද ලිපිය | රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමත පුද්ගලයන්ගේ ලැයිස්තුවෙහි නොමැති පුද්ගලයින් දෙදෙනෙකුට රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කර තිබුණි. | ජනපති කාර්යාලය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. | පාර්ලිමේන්තු නියෝජ්‍ය ලේකම් හා කාර්ය මණ්ඩල ප්‍රධානී යන තනතුර දරන නිලධාරියාට විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇති ලිපිය සොයා ගැනීමට අපහසුය. මහාචාර්ය ස්වාමීන් වහන්සේට අදාලව |

අනුමැතිය ලබා දී තිබු ලිපිය අස්ථානගත වී ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී නිරවුල් කරන ලද රු.4,392,614 ක බැරකම් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | සියලු බැරකම්, සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. | බැරකම් ලේඛනය යාවත්කාලීන කර ඉහත අඩුපාඩු මග හරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08 ක් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.7,412,221 ක බැරකම්වලට එකඟ වී තිබුණි. | මුදල් රෙගුලාසි 216(6) ප්‍රකාරව බැරකම්වලට එළඹීමේදී ප්‍රතිපාදන තිබේදැයි බැලිය යුතුය. | ජල විදුලි බිල්පත් සඳහා මාස 12 කට ඇස්තමේන්තු සකස් කරන අතර සෑම විටම දෙසැම්බර් මස බිල්පත ඊලග වර්ෂයේ ගෙවීමට සිදු වේ. කෙසේ නමුත් වර්ෂය තුල මාස 12 ක බිල්පත් ගෙවීමක් සිදු වන බැවින් ප්‍රතිපාදන ඉක්මවීමක් සිදු නොවන බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | එළඹෙන ලද බැදීම් පිළිබඳ ප්‍රකාශය අනුව ප්‍රතිපාදන ඉක්මවා රු.42,101,817ක වටිනාකමට බැදීම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව බැදීම්වලට එකඟ වීමේදී ප්‍රතිපාදන පිළිබඳ සැලකිලිමත් විය යුතු වීම. | නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේදී පවතින ප්‍රතිපාදන ප්‍රමාණයට අනුව බැදීම්වලට එළඹීමට කටයුතු කරමි. |
| (ඈ) | IBM World Trade Corporation ආයතනය සමඟ 2018 ජුනි 07 දින රු. 1,134,064 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවකට එළඹ තිබූ අතර එය මූල්‍ය | සියලු බැදීම්, බැරකම් හා බැදීම් ප්‍රකාශයේ සටහන් කළ යුතු වීම. | නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේදී පවතින ප්‍රතිපාදන ප්‍රමාණයට අනුව බැදීම්වලට එළඹීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල බැඳීම් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. | | |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලබාගන්නා ලද අතුරු අග්‍රිම අදාළ කාර්යය නිම වී දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවත්, අත්තිකාරම් 13 ක් පියවීමේදී දින 16 ක සිට මාස 11 ක් දක්වා කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. | 2015 ජූලි 14 දිනැති අංක 2015/03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | නිලධාරීන් හතර දෙනෙකුට ලබාදුන් අත්තිකාරම් මුදලින් වියදම් නොවී අත ඉතිරිව තිබූ රු. 60,264 ක මුදලක් දින 16 ක සිට දින 56 ක් දක්වා කාලයක් අත රඳවාගෙන තිබුණි. | සැලසුම් සහගත පරිදි කාර්යයන් සඳහා අත්තිකාරම් යෙදවීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 11 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.38,048,122 ක් විය. අධි ප්‍රතිපාදනය සලසා තිබීම නිසා වැය විෂයයන්ට අදාල ඉතිරිවීම් සියයට 7ක සිට සියයට 29ක් දක්වා අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටු වන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ඇස්තමේන්තු කළ කල්බදු වාරිකය අඩුවීම, පුහුණුවීම් ක්‍රියාත්මක නොවීම, මගී නිෂ්කාශන කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කල නිලධාරීන් නොයෙදීම හා වාහන කුලී ගෙවීම් ප්‍රමාදවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණ රු.122,000,000 ක ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටු වන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | උපකරණ සැපයීම් ආයතනය මගින් සැපයීමට නොහැකි බව දැනුම් දීම හා කලුදිය වත්ත ඉදිකිරීමට නියමිතව තිබූ නීති බලගැන්වීමේ පහසුකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම අවලංගු කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**2.4** **තැන්පත් ශේෂයන්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ----------- | ----------------------------- |
| ද්විත්ව පුරවැසි සහතික ලබාගැනීම සඳහා පුද්ගලයෙක් විසින් ගෙවන ලද රු. 300,000 ක මුදලක් එම පුද්ගලයාට ලබා නොදී පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කල C19160039060 අංක හිමි ඒ.විමලානන්දන් මහතා විසින් එම අයදුම්පතට අදාල මුදල් ගෙවන අවස්ථාවේ එම අයදුම් පත් අංකය සඳහා වැරදීමකින් වෙනත් අයෙකු විසින් අදාල ගාස්තු ගෙවා ඇති බව හඳුනා ගන්නා ලද අතර මුදල් ගෙවූ අයදුම්කරු වෙත ඔහුට අදාල සහතික පත නිකුත් කිරීම සඳහා ඒ. විමලානන්දන් මහතාගෙන් නිශ්චිත ගාස්තුව අයකොට තැන්පත් ගිණුමේ රඳවා තිබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම මගින් ප්‍රසම්පාදන කාර්යයන් 16 ක් ඉටු කිරීමට රු.මිලියන 1,060.6 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් කාර්යයන් 3 ක් සඳහා වෙන්කළ රු.මිලියන 869.7 ක් හෙවත් සියයට 82 ක කාර්යයන් ඉටු කර නොතිබුණි. | සැලසුම් කල කාර්යයන් නිසි පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව 2018 ජනවාරි 01 දින බලයලත් නිලධාරි තනතුරු 132 ක පුරප්පාඩු පැවති අතර 2018 වර්ෂයේ බලයලත් නිලධාරින් 113 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට බලයලත් නිලධාරින් 19 කගේ පුරප්පාඩු පැවතිය යුතු වුවත් 2018 කාර්යසාධන වාර්තාව ප්‍රකාර බලයලත් නිලධාරින් 55 කගේ පුරප්පාඩු පැවතීම දක්වා තිබුණි. | නිවැරදි කාර්ය මණ්ඩලය වාර්තාවලට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. | පිලිතුරු ලබා දී නොතිබුණි |
| (ආ) | 2018 වර්ෂයේ නිකුත් | නිවැරදි තොරතුරු | පිලිතුරු ලබා දී නොතිබුණි |

| | | |
|---|---|---|
| කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව කාර්ය සාධන වාර්තාවේ ගමන් බලපත්‍ර අංශයේ තොරතුරු ප්‍රකාර 603,732 ක් වුවත් එම වාර්තාවේ නිකුත් කරන ලද ගමන් බලපත්‍ර එක් දින සේවය සහ සාමාන්‍ය සේවය යටතේ වෙන්කල විට නිකුත් කරන ලද මුළු ගමන් බලපත්‍ර සංඛ්‍යාව 603,725 එනම් ගමන් බලපත්‍ර 7 ක වෙනසක් නිරීක්ෂණය වීම ගැටළු සහගත විය. | කාර්යසාධන වාර්තාවේ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු වීම. | |

**3.3 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------- | ----------------------------- |
| 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය 2.3 ඡේදය විධිවිධාන ප්‍රකාරව මෝටර් රථයක් ප්‍රසම්පාදන කාර්යයට අදාලව සැපයුම්කරු තෝරා ගැනීමේදී අවශ්‍ය නිර්ණායකයන් පරීක්ෂා කර ප්‍රසම්පාදන තීරණයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදිව සැපැයුම්කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි |

**3.4 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ----------------------- |
| (අ) | Lexmark MS 310 ටෝනර් මිලදී ගැනීමේදී විගණනය වෙත ලබාදුන් | රජයට පාඩුවක් නොවන ආකාරයට ප්‍රසම්පාදනයක් සිදු කිරීමට තීරන ගැනීමට | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මිල හා දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති මිල අතර රු. 2,397,500 ක අලාභයක් සිදුවී තිබුණි. | කටයුතු කළ යුතු වීම. | |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට මැද පෙරදිග රටවල් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම අවසන් කර තිබුණි. එසේ වුවද මැදපෙරදිග රටවල් සඳහා නිකුත් කරන රු.2,580,000 ක් වටිනාකමැති හිස් විදේශ ගමන් බලපත්‍ර 4,000 ක තොගයක් ගබඩාවේ පැවතුණි. | රජයට පාඩුව අවම වන ලෙස කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | නිකුත් නොකර ගබඩාවේ ගොඩගසා ඇති රු.7,792,256 ක් වටිනාකමැති හිස් විදේශ ගමන් බලපත්‍ර වර්ග 8 ක් වර්ෂ 15 ක පමණ කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. | භාවිතයට ගත හැකි දැයි පරීක්ෂා කර බලා අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | 2018 වර්ෂයේ නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාවට සාපේක්ෂව විවිධ දෝෂයන් හේතුවෙන් රු.2,957,970 ක් වටිනා ගමන් බලපත්‍ර 4,586 ක් අවලංගු කර තිබුණි. | දෝෂයන් අවම කිරීමට කටයුතු කළ යුතු වීම. | පිලිතුරු ලබා දී නොතිබුණි. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් | සියලුම විගණන විමසුම්වලට නියමිත | පිලිතුරු ලබා දී නොතිබුණි. |

| | |
|---|---|
| කරන ලද විගණන විමසුම් 4 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 3 කට 2019 අගෝස්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 5,133.04 ක් විය. | කාලයතුල පිළිතුරු සපයා අදාල නිවැරදි කිරිම් කළ යුතුවීම. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත් 5 ක් නිකුත් කර නොතිබූ අතර එම ගමන් බලපත් අවලංගු කර නොතිබුණි. මේ සඳහා කුමක් සිදුවූයේද යන්න තහවුරුවක් ලබාදී නොතිබුණි. | අවලංගු කරන ලද ගමන් බලපත් පිලිබඳ විස්තර අවලංගු කල ගමන් බලපත් ලේඛනයේ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුවීම. | නිකුත් නොකරන ලද එක් එක් රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත් ප්‍රතික්ෂේප කිරීමට බලපානු ලබන හේතුව පරිගණක දත්ත පද්ධතියට අනුව පහත ඉදිරිපත් කරන අතර, අවලංගු කරන ලද සෑම රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රයක් වෙනුවට වෙනත් විදේශ ගමන් බලපත්‍ර අදාල අයදුම්කරුවන් වෙත නිකුත් කොට ඇත. තවද අවලංගු කරන ලද විදේශ ගමන් බලපත්‍ර නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව විනාශ කරනු ලබන බවද වැඩිදුරටත් සඳහන් කරමි. |
| (ආ) | 2016 අගෝස්තු 15 දිනැති අංක 01/2016 දරන අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත් ඉල්ලුම් කිරීමේදී ගමන් බලපත්‍රයේ වලංගු විය යුතු කාලසීමාව ආයතන | වලංගු කාලය තහවුරු වනසේ පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරිමට කටයුතු කළ යුතුවීම. | ඔබ විසින් සඳහන් කරනු ලබන අංක 01/2016 දරණ චක්‍රලේඛය අදාල වනුයේ රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත් සම්බන්ධව නොව රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල වන චක්‍රලේඛයය.කෙසේ නමුදු රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී ආයතනයන්හි ප්‍රධානියාගේ නිර්දේශ මත/ විශ්‍රාම ගනු ලබන කාලය |

| | | |
|---|---|---|
| ප්‍රධානීන් විසින් රාජකාරීමය අවශ්‍යතාවය පදනම් කර ගෙන තීරණය කළ යුතුයි. එසේ වුවද පරිගණක පද්ධතිය අනුව සියලුම රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත් වසර 10 ක වලංගු කාලයක් සඳහා නිකුත් කර තිබුණි. | | දක්වා සහ විදේශ දූත මණ්ඩල සේවය සඳහා යනු ලබන නිලධාරීන් සඳහා විදේශ කටයුතු අමාත්‍යංශය මගින් තීරණය කරනු ලබන කාල සීමාවට පමණක් රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. එවැනි අවස්ථාවක විදේශ ගමන් බලපත්‍රයෙහි හතරවැනි පිටුවෙහි එකී පිටසන කරනු ලැබේ. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පරීක්ෂාවේදී කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 89 ක් පවත්වා ඇති බව සඳහන් කර තිබුණද 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ප්‍රකාරව 2018 වර්ෂය සඳහා පවත්වා තිබුණේ පුහුණු වැඩසටහන් 58 ක් පමණි. | නිවැරදිව කාර්ය සාධන වාර්තාවේ තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1203 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 1065 ක් වීම හේතුවෙන් පුරප්පාඩු ප්‍රමාණය 138 ක් විය. | අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |